

Pawura
Digital Magazine
2023 January 14 Sunday
25 Issue
© SHEN ART PHOTOGRAPHY
Pawura
Digital Magazine
නව්‍යකරණයෙන් ඉදිරියට
ඩිජිටල් කලාවේ නවතම පෙරළිය
Pawura Digital Magazine



# බත බුලතින් සරු වෙන්ටයි - හිරු දෙවියන් නමදින්ටයි
# තෛ මාසේ කෝලම් මැද - කිරි පැණියෙන් ඉතිරෙන්ටයි

එසරක් ගෙවී නව වසරක් උදාවත්ම ලොව පුරා වෙසෙන හින්දු ජනයා දමිළ බසින් තෛ මාසය ලෙසින් හඳුන්වන එනම් ජනවාරි මාසයේදී පසුගිය වසරේ සරුසාර අස්වැන්නක් ලබා දීම හේතුවෙන් සූර්ය දෙවියන් උදෙසා පුද පූජා පැවැත්වීම සෑම වසරකම ජනවාරි මස 12,13,14,15 යන දිනයන් හිදී සිදු කරනු ලබයි.

සූර්යා ධනු රාශියේ සිට මකර රාශිය දක්වා ගමන් කරනු ලබන මෙම වකවානුව මකර සංක්‍රාන්තිය යනුවෙන්ද හින්දු ජනයා විසින් හඳුන්වනු ලබනවා. පොංගල් යන්නෙන් උත්සවය යන අරුත දැන වෙන අතර තෛ මාසයේදී සූර්යා උදෙසා කිරි ඉතිර වීම සිදු කරනු ලබයි.

හින්දු ජනතාව තෛපොංගල් උත්සවය සැමරීමේ මූලික පරමාර්ථය කරගෙන ඇත්තේ ආහාර පාන සපයා ගැනීමට උදවු උපකාර කරන සියලූම ජීව අජීව රාශින්ට කෘතවේදී බව ප්‍රකාශ කිරීම වේ.

ක්‍රි. පූ. 2500 - 3000 අතර කාලයේ බටහිර ආසියාවේ සිට ඉන්දියාවට සංක්‍රමණය වූ ආර්යයන් අතරේ තමන්ගේ අස්වනු පැසීම, වියළීම හා ඒ කටයුතු කර ගන්නට යහපත් කාලගුණයක් ලබා දීම වගේ ලොකු සේවාවක් කරන හිරු දෙවියන්ට ගෞරව කිරීමක් විදියට සූර්ය නමස්කාරය සිදු කරනු ලැබූ බව ඉතිහාසයේ සඳහන්.

තෛපොංගල් උත්සවයේ එක් එක් දවස් වෙනුවෙන් විශේෂිත උත්සව තිබෙනවා. පවුලට වෙන් වූ උත්සවය බෝගි පොංගල් ලෙස හැඳින්වෙන අතර සූර්ය පොංගල් උත්සවයේදී හිරු දෙවියන්ට පුද සත්කාර කරනවා.

හින්දු උත්සව වලදී අඹ පත්‍ර වලට හිමි වන්නේ සුවිශේෂී ස්ථානයක්. මෙහිදීද අඹ පත්‍ර වලින් සැරසිලි කර හොඳින් හිරු එළිය වැටෙන තැනකදී කිරි ඉතිරවීම සිදුකරනු ලබනවා . එම ස්ථානය ගොම මැටි ගා පිරිසිදු කර අඹ පත්‍ර වලින් කොඩි වැල් එල්ලා අලංකාර කිරීමත් හාල් පිටිවලින් "කෝලම්" රටා ඇඳීමත් සිදු කරනු ලබනවා. අලුත් මුට්ටියක කිරි උතුරවා එයට හකුරු මිශ්‍ර කර දෙවියන් පුජා කරන අතර නිවෙස්වල සහ දේවස්ථානවල කිරි උතුරවනු ලබනවා.

උත්සවයේ තුන්වැනි දිනය "මාඩු පොංගල්" යනුවෙන් හැඳින්වෙනවා. එදාට ගවයා විශේෂිතයි. පෙරදා හවස ඉර බහින්න ආසන්න වෙලාවට ගව සහ එලුවන්ගේ ගාල් පිරිසිදු කරනවා. ගවයා නාවා , මල් මාලාවලින් සරසවා අලංකාර කරන අතර නිවසට පිට එලිමහනක අලුත් මුට්ටියක හකුරු, කිරි, සීනි, ගිතෙල්, මිදි එකතු කළ කිරි භාජනයක් ලිප තබනවා. මෙය උතුරන විට එතැන සිටින පිරිස "පොංගොල්, පොංගොල්" යැයි කියන අතර හක්ගෙඩිය පිඹ ආශිර්වාද කරනවා.


උත්සවයේ හතරවැනි දවසේ බතක් සහ හත්මාලුවක් පිස කපුටන් සිටින තැන් වල එය විසුරුවා හරිනවා.
අලුත් ළිපක, අලුත් මුට්ටියක කිරි උතුරුවා ගැනීම මෙම උත්සවයේ දී කෙරෙන ප්‍රධාන කටයුත්තක් ලෙස හැඳින්විය හැකි යි. මෙම කිරි ඉතිරෙන අවස්ථාවේ දී නිවසේ සියලු දෙනාම " පොංගලෝ පොංගල්" යනුවෙන් හඬ නඟා පැවසීම සාමාන්‍ය සම්ප්‍රදාය යි.

හින්දු හා දමිළ සම්ප්‍රදායට අනුව මෙම වකවානුව තුළ ජන්මය ලබන්නන් සශ්‍රීකත්වයේ සංකේතයක් ලෙස සලකනු ලබනවා.

ඒ වාගේම හින්දු බැතිමතුන් මෙම උත්සවය සැමරීමේ දී තම අසල්වැසි සියලු ආගම් වල ජනතාවටද උත්සව කාලය මුළුල්ලේ ම ආහාර පාන රස කැවිලි ආදියෙන් සංග්‍රහ කිරීමටද අමතක නොකරයි.

එනම් මේ තෛපොංගල් උත්සවය හරහා ආගමික පුද පූජා ඉටු කිරීමට අමතර ව ජනතාව අතර සාමය සංහිඳියාව එකමුතුකම වැඩි කිරීමත් සිදු වේ. මෙසේ බලන විට තෛපොංගල් උත්සවය හින්දු ආගමට පමණක් සීමා වූ ආගමික සමාජික උත්සවයක් පමණක් නොව මුළු මහත් ජන සමාජයම සමඟිව ඒකරාශි කරනු ලබන උත්සවයක් බව හඳුනා ගත හැකියි. ඔබ සැමටත් සශ්‍රීකත්වය සපිරුණු තෛපොංගල් සමයක් වේවා..!

සටහන -
ප්‍රබුද්ධිකා හේරත්





# தை பொங்கல்

ஒரு வருடம் முடிந்து, ஒரு புத்தாண்டு விடியும்போது, உலகம் முழுவதும் வாழும் இந்து மக்கள், தமிழில் தை மாதம் என்று அழைக்கிறார்கள், அதாவது ஜனவரியில், 12, 13, 14, 15 ஆகிய தேதிகளில் சூரியக் கடவுளுக்கு அர்ச்சனை செய்கிறார்கள். முந்தைய ஆண்டு நல்ல விளைச்சல் காரணமாக ஒவ்வொரு ஆண்டும் ஜனவரி மாதம்.

இம்முறை சூரியன் தனுசு ராசியில் இருந்து மகர ராசிக்கு சஞ்சரிக்கும் போது மகர சங்கராந்தி என்றும் இந்துக்கள் அழைக்கின்றனர். பொங்கல் என்றால் பண்டிகை என்றும் தை மாதத்தில் சூரியனுக்கு பால் கறக்கும் வழக்கம் உள்ளது.

தைப் பொங்கலைக் கொண்டாடுவதில் இந்து மக்களின் முக்கிய நோக்கம் “உணவு மற்றும் பானங்கள்“ வழங்க உதவும் அனைத்து உயிரினங்களுக்கும் நன்றி தெரிவிப்பதாகும்.

கி.பி பொ.ச. 2500 முதல் 3000 வரை மேற்கு ஆசியாவில் இருந்து இந்தியாவிற்கு குடிபெயர்ந்த ஆரியர்களிடையே, தங்கள் பயிர்களை பழுக்க வைப்பது மற்றும் உலர்த்துவது மற்றும் நல்ல வானிலை வழங்குவது போன்ற சிறந்த சேவை செய்த சூரிய கடவுளை போற்றும் விதமாக சூரிய வழிபாடு நடத்தப்பட்டது என்று வரலாறு கூறுகிறது. அந்த.

தைப் பொங்கல் பண்டிகையின் ஒவ்வொரு நாளும் சிறப்பு விழாக்கள் உள்ளன. குடும்பத்திற்காக அர்ப்பணிக்கப்பட்ட பண்டிகை போகி பொங்கல் என்று அழைக்கப்படுகிறது மற்றும் சூரிய பொங்கல் பண்டிகையின்



இந்து பண்டிகைகளில் மா இலைகளுக்கு தனி இடம் உண்டு.இங்கும் மா இலைகளை அலங்கரித்து வெயில் படும் இடத்தில் பால் ஊற்றுவார்கள். அந்த இடம் சாணம் களிமண்ணால் சுத்தம் செய்யப்பட்டு, மா இலைகளில் கொடி கொடிகளை தொங்கவிட்டு, அரிசி மாவில் இருந்து "கோலம்" வடிவங்கள் வரைந்து அலங்கரிக்கப்பட்டுள்ளது. புதிய பானையில் பால் காய்ச்சி, அதனுடன் வெல்லம் கலந்து கடவுளுக்கு அர்ச்சனை செய்து, வீடுகளிலும், தேவாலயங்களிலும் பால் காய்ச்சப்படும்.

திருவிழாவின் மூன்றாம் நாள் “மாடு பொங்கல்” என்று அழைக்கப்படுகிறது. அன்றைய தினம் மாடு சிறப்பு.
முந்தைய நாள் மாலை சூரியன் மறையும் போது மாடு மற்றும் ஆடு தொழுவங்கள் சுத்தம் செய்யப்படுகின்றன. பசுவைக் குளிப்பாட்டி, மாலைகளால் அலங்கரித்து, வெல்லம், பால், சர்க்கரை, நெய், திராட்சை ஆகியவற்றைக் கொண்டு புதிய பானையை வீட்டின் வெளியே அடுப்பில் வைப்பார்கள். இது கொதித்ததும் அங்குள்ள மக்கள் "பொங்கோல், பொங்கல்" என்று கூறி ஹக்கெடியா பிம்பத்தை ஆசிர்வதிப்பார்கள்.

நான்காம் நாள் திருவிழாவில் காக்கைகள் இருக்கும் இடங்களில் சாதம், மீன்கள் சமைத்து சிதறிக்கிடக்கும்.
புதிய அடுப்பு மற்றும் புதிய பாத்திரத்தில் பால் காய்ச்சுவது இவ்விழாவின் முக்கிய நிகழ்ச்சிகளில் ஒன்றாகக் கூறலாம். இந்தப் பால் பொங்கி வழியும் போது வீட்டில் உள்ள அனைவரும் பொங்கலோ பொங்கல் என்று கத்துவது வழக்கம்.

இந்து மற்றும் தமிழ் பாரம்பரியத்தின் படி, இந்த காலகட்டத்தில் பிறந்தவர்கள் கருவுறுதலின் அடையாளமாக கருதப்படுகிறார்கள்.

அதேபோல், இந்து பக்தர்கள் தங்கள் சுற்றுப்புறத்தில் உள்ள அனைத்து மதத்தினருக்கும் உணவு, பானங்கள் மற்றும் இனிப்புகள் மூலம் விழாக்காலம் முழுவதும் மகிழ்விக்க மறக்க மாட்டார்கள். அதாவது, இந்த தைப் பொங்கல் பண்டிகையின் மூலம் சமய வழிபாடுகளை மேற்கொள்வதுடன், மக்களிடையே அமைதி, நல்லிணக்கம், ஒற்றுமையை அதிகரிக்க வேண்டும். இப்படிப் பார்க்கும் போது, தைப்பொங்கல் பண்டிகை இந்து சமயத்திற்கு மட்டுப்படுத்தப்பட்ட சமய, சமூகப் பண்டிகை மட்டுமல்ல, ஒட்டுமொத்த சமுதாயத்தையும் ஒருங்கிணைக்கும் பண்டிகை என்பதை அறியலாம். உங்கள் அனைவருக்கும் தை பொங்கல் திருநாளாக அமையட்டும்..!

- பிரபுத்திகா ஹேரத். -



**ආයුර්වේද වෛද්‍ය හසිත කොතලාවල මහතා.**

බටහිර වෛද්‍ය ක්‍රමයට සමගාමීව අද සමාජය තුළ බහුල වශයෙන් කතාබහට ලක්වන තවත් එක් වෛද්‍ය ක්‍රමයක් ලෙස ආයුර්වේද වෛද්‍ය ක්‍රමය හඳුන්වයි. ආයුර්වේද වෛද්‍ය ක්‍රමය පිළිබඳ සාකච්ඡා කිරීමේදී අප කාගේත් සිහියට නැගෙන එක් වෙද පරපුරක් වන්නේ වීදාගම වෙද පරපුරයි. වීදාගම වෙද පරපුරේ ආරම්භය මීට වසර ගණනාවකට ඉහත දී සිදු වූවකි. මේ ආයුර්වේද වෛද්‍ය විද්‍යාව යනු දේශීය වෙදකමමද? ආයුර්වේද වෙදකමට අද පවතින තත්ත්වය මොනවගේ ද? ඔබත් ආයුර්වේද බෙහෙත් ලබාගන්නට බියෙන් පසු වන කෙනෙක් ද? ඔබටත් මෙවැනි ගැටළු තිබේ ද? එසේ නම් මේ ඒ පිළිබඳ  සාකච්ඡාවකි.

මුල් කාලීනව දැනුම ගබඩා වූයේ පන්සල් ආශ්‍රිතව යි. දැනුම සමාජ ගත කිරීමට පූර්ණ දායකත්වය සැප වූයේ එවක සිටි භික්ෂූන් වහන්සේලා වේ. දැනුම් පද්ධතියට අමතරව තව තව වෙනස් දේවල් සමාජගත කිරීම ඔවුන්ගේ තවත් අපේක්ෂාවක් විය. එහිදී යන්ත්‍ර මන්ත්‍ර, වෙදකම යනාදිය ඔවුහු තෝරාගෙන ඇත. මේ සියලුම දේවල් සමාජගත කර ප්‍රචලිත කිරීමට දායක වූ පිරිසක් ලෙසින් එකල සිටි භික්ෂූන් වහන්සේලා හඳුන්වාදිය හැකි වේ. මෙලෙස පැමිණෙන්නා වූ ගමන් මගේ වීදාගම පන්සල ආශ්‍රිතව බිහි වූ එක් වෙද පරපුරක් ලෙස වීදාගම වෙද පරපුර හඳුන්වයි. වීදාගම මෛත්‍රී හිමි, වෑත්තෑවෙ හිමි එහි ආභාසය ලැබූවෝ වෙති. පසුකාලීනව වීදාගම පියරතන හිමි මෙම වෙදකම ඉහළ ස්ථානයකට සමාජය තුළ ගෙන ඒමට උත්සුක වී ඇත. වීදාගම වෙද පරපුර යනු අප කවුරුත් හඳුනන වර්තමානය තුළත් ප්‍රසිද්ධියක් උසුලන කැඩුම් බිඳුම් ආශ්‍රිත ප්‍රබල වෙද පරපුරකි. පියරතන හිමියන් විසින් ඔහු යටතේ ගෝල බාලයන් ගිහි පැවිදි දෙපිරිසටම ශිල්ප ශාස්ත්‍ර ඉගැන්නුවේය. ඉන් බිහිවූ එක් වෙද පරපුරක් ලෙසින් කොතලාවල වෙද පරම්පරාව  හඳුන්වයි.

කොතලාවල වෙද පරම්පරාව යනු ආයුර්වේද කැඩුම් බිඳුම් වෙදකම සඳහා ප්‍රමුඛස්ථානයක් ලබන ඉතා ඉහළ ඇගයීම් ගරු බුහුමන් වලට පාත්‍ර වූ එක් වෙද පරපුරකි. එවක ආයුර්වේද සංස්ථාවේ හිටපු සභාපති වී.එස් කොතලාවල මහතාගෙන් ඇරඹුණු මේ වෙද පරපුර ඉදිරියටම ගෙන ආ නව පුරුකක් පිළිබඳව අද  අපි කතාබහට  යොමු  වෙමු.

ඔහු නමින් වීදාගම පාරම්පරික ආයුර්වේද වෛද්‍ය, සිද්ධාලේප ආයුර්වේද රෝහලේ විකලාංග පිළිබඳ ආයුර්වේද වෛද්‍ය හසිත කොතලාවල මහතාය. වී.එස් කොතලාවල මහතාගේ පුතුන් දෙදෙනාගෙන් එක් පුත්‍රයෙක් වන මොහු ආයුර්වේද වෙදකම ඉහළ ස්ථානයකට ගෙන ගිය අයෙකි. අද අපි ඔහුත් සමඟ මේ සාකච්ඡාව ආරම්භ  කරමු.

**01. ඔබ මුලින්ම ආයුර්වේද වෙදකමට යොමු වන්නේ කොහොමද?**

මම දැක්කා අපේ තාත්තට සමාජයෙන් ඒ වගේම මිනිසුන්ගෙන් ලැබෙන ගෞරවය. සමහරු ඔහුට බුදුබව ප්‍රාර්ථනා කළා. එතනදි මට ලොකු උත්තේජනයක් ලැබුණා. ඉතින් මටත් ඕන වුණා සමාජයට විශේෂිත පුද්ගලයෙක් වෙන්න. මේ වෙදකම කරන්නන්වාලේ කරන්න බැහැ. අපේ ගෙදරත් සෑමවිටම විද්‍යාත්මක පදනමක් තිබුණා. පරම්පරාවෙන් ලැබුණු දේත් එක්ක මම ගොඩක් අධ්‍යයනය කිරීම් පරිශීලනය කිරීම් අත්හදාබැලීම් සිදු කළා.
මේ දේවලුත් එක්ක මෙච්චර වටිනා දෙයක් දාලා වෙනත් දෙයකට යොමු වීමට වඩා මෙම වෙදකම ම ඉදිරියට කරගෙන යන්න මට හිතුණා. ඉතින් මට වෙනත් දෙයක් අවශ්‍ය නැහැ කියලා හිතුණ නිසා මම මේ වෙදකමට  යොමු  වුණා.

**02. මේ දිනවල වෛද්‍ය කටයුතු කොහොමද?**

ඉතාම හොඳින් කරගෙන යනවා.
නිතරම රෝගීන්ට ප්‍රතිකාර කරනවා.

**03 ආයුර්වේද වෙදකම විදියට ඔබ දකින්නේ මොකක්ද?**

ඇත්තටම වෛද්‍ය වෘත්තිය ප්‍රධාන කොටස් කිහිපයකටම බෙදෙනවා. මිනිසුන් හිතන් ඉන්නවා වෙදකම කියන්නේ ලෙඩ්ඩුන්ට බෙහෙත් දෙන එක කියලා. ඒත් ආයුර්වේද වෙදකම කියන්නේ එහෙම එකක් නෙවේ. ආයුර්වේද වෙදකම කියලා කියන්නේ ස්වස්ථ වූ පුද්ගලයාගේ සුවස්ථ බව ආරක්ෂා කිරීම සඳහා උපදේශන හා පසුබිම් සැකසීමයි. ඒ කියන්නේ නිරෝගී පුද්ගලයින්ගේ නිරෝගී බව ආරක්ෂා කිරීම යි. මේක තමා වෛද්‍යවරයාගේ පළමු යුතුකම. දෙවන යුතුකම තමයි රෝගී වූ පුද්ගලයා නිරෝගී කිරීම. ඒත් අද සමාජය තුළ වෛද්‍යවරයාට දීලා තියෙන්නේ ලෙඩ්ඩුන්ව සනීප කරන එක. ඒක තමා ඇත්තටම ප්‍රධාන කාර්‍යභාර්‍යය. නමුත් අපිට කරන්න පුලුවන් වැඩ පිළිවෙළක් තියෙනවා නිරෝගී පුද්ගලයාගේ නිරෝගීභාවය  ආරක්ෂා කිරීමට. ඉතින් මම දකින විදියට ආයුර්වේද වෙදකම කියන්නේ  ඒකට.

**04. ආයුර්වේද වෛද්‍ය විද්‍යාව සහ දේශීය වෛද්‍ය විද්‍යාව දෙකක්ද?
එකක්ද?**

අපිට ඕනි නම් මේක වෙන් කරලා පෙන්නන්නත් පුලුවන්. එහෙම නැත්නම් එකක් කියලා පෙන්නනත් පුලුවන්. මේ වෙදකම අතර ඇති යම් යම් සමානකම් නිසා තමා ඒ වෙනස්වීම් පිළිබඳව සැකය මතු වෙලා තියෙන්නේ. ආයුර්වේද වෙදකම ඉන්දියාවෙන් ආභාසය ලැබූවත් ඒකට අවශ්‍ය ඖෂධ ඉන්දියාවෙන්ම ගෙන් වීම අවශ්‍ය නැහැ. ලංකාවෙනුත් එම ඖෂධ හොයාගන්න පුළුවන්. එම ඖෂධ ම යොදාගෙන දේශීය නිෂ්පාදන සිදු කරනවා. ඒ වගේම දේශීය වෛද්‍යවරු ආයුර්වේද බෙහෙත් ද , ආයුර්වේද වෛද්‍යවරු දේශීය බෙහෙත් ද පාවිච්චි කරනවා. මේ විදිහට දෙපාර්ශ්වයම සහයෝගීව මේ කාර්යය සිදු කරන නිසා එහි වෙනස්කම් හඳුනා ගැනීමට අපහසු වෙලා තියෙනවා. නමුත් මගේ පෞද්ගලික මතයට අනුව නම් මේක එකක් විදිහට සැලකුවත් දෙකක් විදියට සැලකුවත් ඒ දෙකෙන්ම ලෙඩ්ඩු සනීප වෙනවා නම් එච්චරයි. ඒකෙ අවසාන ප්‍රතිඵලය රෝගීන් සුව කිරීමයි. ඉතින් අපි එකට ගමනක්  යා  යුතුයි.

**05. සිංහල බෙහෙත් වලින් හොඳ වෙන්න කල් යනවා, සෙම ඇවිස්සෙනවා මේක ඇත්තක් ද?**

ඔව්, කාලයක් ගත වෙනවා. ඒක අපිත් පිළිගන්නවා. ඒ වුණාට බටහිර වෙදකමට වඩා ඉක්මනිනුත් අපි ලෙඩ සනීප කරලා තියෙනවා. විශේෂයෙන්ම කැඩුම් බිඳුම් වෙදකම. ඇත්තටම අපි කරන්න ඕනි රෝග මූල හොයන් ගිහින් ඒ රෝග මූලයට බෙහෙත් කරන එක. එතකොට අපිට රෝග ලක්ෂණය අවම කර ගන්න පුළුවන්. ඒකට අපිට යම් කාලයක් ගත වෙනවා. මේ වෙදකම කියලා කියන්නේ රෝගියා නිට්ටාවටම සුව කිරීම උදෙසා දරනු ලබන ප්‍රයත්නයක්. ඒකට අපි වැඩ කරනවා, පුළුවන් තරම් උත්සහා කරනවා රෝග විනිශ්චය කරලා රෝග මූලය හඳුනාගෙන ඊට ප්‍රතිකාර කරලා රෝගය නිරෝගී කරන්න. එතකොට මේ සෙම ඇවිස්සීම ගැන කතා කළොත් ඒකට ඇත්තෙන්ම ජනතාවට දොස් කියලා බෑ. එයට වෙද මහත්වරු දක්ෂ වෙන ඕනි. ඒ සියලූම දේවල් පාලනය වෙන විදියට යෝග නැත්නම් බෙහෙත් දෙන්න අපි දැනගෙන ඉන්න  ඕනි.

**06. මිත්‍යා මත සමඟ ආයුර්වේදය පවත්වාගෙන යන්නේ කොහොම ද?**

වෛද්‍යවරයා සහ වෛද්‍ය ක්‍රමය පිළිබඳ තිබෙන විශ්වාසය මත තමා මේක සිදු

කරන්නේ. තමන් පිළිබඳවත් තමන්ගේ චරිතය පිළිබඳවත්, තමන් ලබා දෙන බෙහෙත් පිළිබඳවත් ,තමන් සනීප කරපු අය පිළිබඳවත් හොඳ පසුබිමක් සමාජය තුළ තියෙනවා නම් ඒ පිළිබඳව මිනිසා තුළ කට වචනයක්, විශ්වාසයක් වගේම ගරුත්වයක් තිබේ නම් අපිට පුළුවන් ඒ හරහා මේක පවත්වාගෙන යන්න. මේ ආයුර්වේදය පිළිබඳව නිවැරදි අවබෝධයක් සමාජ ගත කළ යුතු ය. අපි අරක කරා මේක කරා කියනවාට වඩා අපි යමක් කරලම පෙන්නුවොත් අපිට ඒ සාක්ෂි යොදා ගන්න පුළුවන්. ඒකට තව පුලුවන් ලිඛිත සාක්ෂි, පර්යේෂණ ඉදිරිපත් කරන්න. එමඟින් පුළුවන් සෘජු බලපෑමක් කරන්න සහ ධනාත්මක පිළිතුරක් ලබා ගන්න.

07. බටහිර වෛදකම ආයුර්වේද වෛදකමට බලපෑමක් ද?

මම ඒක ඇත්තටම දකින්නේ සාම්ප්‍රදායික ක්‍රමයට නම් නෙවෙයි. බටහිර වෛදකම තුළිනුත් අපට කරන්න බැරි සමහරක් දේවල් ඉතා දක්ෂ ලෙස කරනවා. ඒ වුණාට ඒ අයත් පිළිගන්න ඕනි දෙයක් තමා එයාලටත් කරන්න බැරි යම් යම් දේවල් ප්‍රමාණයක් අපිත් කරනවා කියන එක. මම නම් කියන්නේ මේ දෙක අතර භේද තියා ගැනීමක් අවශ්‍ය නැහැ. දෙගොල්ලොම කරන්නේ රෝග සුව කිරීම නම් එතන කිසිම තර්කයක් ගොඩනැඟීම අවශ්‍ය වන්නෙ නැහැ. අනිත් එක තමා අපිට කාටවත් බලපෑමක් කරන්නත් බැහැ. ක්‍රියාව තුළිනුයි අපි පෙන්නන්න ඕනි. එතකොට මම නම් හිතන් නෑ මේක එකිනෙකට බලපෑමක් වෙයි කියලා.

08. ඖෂධ වර්ග නොදැනීම සහ රෝගියාට බෙහෙත් වර්ග සොයා ගැනීමට නොහැකි වීම ආයුර්වේදය පවත්වාගෙන යාමට අභියෝගයක් ද?

ලංකාවේ තවමත් බෙහෙත් වර්ග තියෙනවා. ඒ බෙහෙත් අඳුරන් නැති එක තමා තියෙන ලොකුම ප්‍රශ්නේ. ඒකට අපි අපිම තමයි වග කියා ගන්න ඕනි. ඉස්සර නම් මට මතකයි අපි පුංචි කාලේ පොතක ගස් වල පැළෑටි වල කොළ වර්ග අලවලා ඒ වගේ නම් මතක තියා ගත්තා. ඒකෙන් පුංචි දැනුම් ගබඩාවක් එකතු කරගත්තා. දැන් ඒව නෑ. අධ්‍යාපන ක්‍රමය තුළින් ම ඒවා අයින් කරලා තියෙන්නේ. ඉතිහාසය හමස් පෙට්ටියට දාලා තියෙන්නේ. අපිට මේකට අත්දැකීම් තියෙන්න ඕනි. කරලා බලලා දැනගෙන ඉන්න ඕනි. අපේ ගිලිහුණ සංස්කෘතියේ හර පද්ධතිය විද්‍යාත්මක ක්‍රමවේද පර්යේෂණ ඔස්සේ ඉදිරියට ගෙන යන්න ඕනි. නමුත් මේ පවතින තත්ත්වයට අපි වෛද්‍යවරු විදිහට මුහුණ දෙන්න ඕනි. ඒ නිසා ඒ අවශ්‍ය බෙහෙත් රෝගියාට සකසලා ලබාදීම තමා හොඳම කාරණාව වෙන්නෙ. මොකද අපිට හොඳ සැපයුම්කරුවො ඉන්නවා. ඒකෙන් අපිට බෙහෙත් වර්ග ලබා ගන්න පුළුවන්. මේකෙදි මම කියන්නේ රෝගියාට ඖෂධ හොයාගන්න කියනවට වඩා අපිම ඒ බෙහෙත් වට්ටෝරු බලලා සකසලා ඔවුන්ට ලබාදීම තමා වටින්නේ.

10. කොරෝනා කාලය තුළ ආයුර්වේදය පවත්වාගෙන ගියේ කොහොමද ?

මම ඒ අභියෝගයට හොඳින් මුහුණ දුන්න කෙනෙක්. මගේ පෞද්ගලික මතයක් තමයි තමන් කරන වෘත්තිය පිළිබඳව සහ තමා සමාජයට කරන සේවය හඳුනාගෙන තියෙන්න ඕනි. මට ඕනෙම තැනක කියන්න පුළුවන් මම ඒ අභියෝගයට හොඳින් මුහුණ දුන්නා කියන එක. මම සිංහල බෞද්ධයෙක් වශයෙන් විශ්වාස ගන්න දෙයක් තමයි කෙනෙක්ට මැරෙන්න වෙලාව ආවොත් මැරෙන්නම වෙනවා නැත්නම් යන්නම වෙනවා.

ඒක කොරෝනා ද රිය අනතුරක් ද වෙන ලෙඩක් ද කියලා නැහැ යන්න වෙලාව ආවොත් වළක්වන්නත් බෑ. මම කොරෝනා කාලය තුළත් බෙහෙත් කළා. කිසිම රෝගියෙක් ට එන්න එපා කිව්වෙත් නැහැ. කැඩුම් බිඳුම් වෛදකම කියලා කියන්නේ දුර ඉඳලා කරන්න පුළුවන් දෙයක් නෙවෙයි. මම රෝගියා ළඟට ගිහින් ප්‍රතිකාර කළා. ඉතින් මට කියන්න සතුටුයි මම අදටත් තවත් ජීවත් වෙනවා. ඒ වගේම ඒ කාලය තුළ මගේ වෘත්තීය නතර කිරීමක් කළෙත් නැහැ.

10. මතු බිහිවන නවක ආයුර්වේද වෙද පරපුරට ඔබ ලබාදෙන උපදේශය කුමක්ද?

උපදෙස් නම් ගණනාවක් තියෙනවා. මුලින්ම තමන්ගේ වෘත්තිය සහ වෘත්තියට ආදරය කරන්න ඕනි. ඒ වගේම නව දැනුම වර්ධනය කරගෙන මෝඩයෙක් නොවී වැඩ කරන්න ඕනි. තමා තව තව දේවල් දැනුමට එකතු කරගෙන, ඒවා එකිනෙකට සංසන්දනය කරන්න ඕනි. විවේචන පැමිණි විට ඒවා උහුලන්න පුළුවන් වෙන්න ඕනේ. ඒ වගේම සාධාරණය විවේචන වල සන්දර්භය තේරුම් ගන්න ඕනේ. මේ සියල්ලටම මුහුණ දෙන්න පුළුවන් අයෙක් වෙන්න ඕනි. තම ක්ෂේත්‍රය වගේම අපිත් දියුණු වෙන්න ඕනේ. ආයුර්වේද වෛද්‍යවරුන් වගේම දේශීය වෛද්‍යවරු සියලු දෙනාටම මම කියන්නේ ඉංග්‍රීසි පෙත්ත අතට ගන්න එපා. ඒ පැත්තට යන්න වෙනම පිරිසක් ඉන්නවා. ඒක කිසිම ප්‍රශ්නයක් නැහැ. නමුත් මම කියන්නේ අපේ වෛද්‍ය පරම්පරා වල සිටින අයට ඔබ අපේම ඖෂධවලින් රෝගීන් සුවපත් කරන්න. ලෙඩ පන්සීයක් සුව කරන්න යනවට වඩා තමන්ට පුළුවන් ලෙඩ දෙකක් හොයාගෙන ඒකට අදාළව රෝගීන්ට ප්‍රතිකාර කිරීමට පටන් ගන්න. ජීවිතයත්, ආර්ථිකයත්, දැනුමත් හදාගෙන හොඳ ගමනක් යන්න.

11. ආයුර්වේදය පවතින්නේ වෛද්‍යවරයාගේ විශ්වාසය මත ද?

ඔව් ඇත්තෙන්ම. අපි ළඟට එන රෝගීන්ට ඒ බෙහෙත් වට්ටෝරු ගැන අවබෝධයක් නැහැ. ඒ නිසා අපි ඔවුන්ට ඒ පිළිබඳව අවබෝධයක් ලබා දෙන්න ඕන. මේවා ඉංග්‍රීසි බෙහෙත් වගේ නෙමෙයි. එතකොට අපි වෛද්‍යවරු විදිහට දැනගන්න ඕනේ රෝගියාට ප්‍රතිකාර කරන කොට ඒ පිළිබඳව හොඳ විග්‍රහයක් කරලා දෙන්න. ඒ කියන්නේ රෝගියාව දැනුවත් කිරීමක් කරන්න ඕනේ. මේකට ඇත්තටම හොඳ සන්නිවේදනයක් අවශ්‍ය වෙනවා. හරි වචන හරි විදිහට භාවිතා කරන්න ඕනේ. හිතේ තියෙන දේ වචන වලට ගන්න බැරි නම් එතැන විශ්වාසයක් පවතින්නේ නැහැ. මේක ගොඩක් අපේ වෛද්‍යවරු අතර පවතින දුර්වලතාවක් විදිහට මම දකිනවා. ඒ නිසා මේකට සන්නිවේදනය ප්‍රබලම කාර්යයක් වෙන්න ඕනි. අපි නිවැරදිව රෝගියා සමඟ කතා කරන විට ඔහුට ඒ රෝගය පිළිබඳව විග්‍රහ කරලා දෙන විට ඔහු තුළ අපි පිළිබඳව ඇති වන්නේ විශ්වාසයක්. ඒකත් වෛද්‍යවරයා සතු කාර්ය භාරයක් විදියට මම දකිනවා. එහෙම නැති උණොත් රෝගීන් අපේ බෙහෙත් ගන්න එන්නේ නැහැ. ඒ නිසා මේක විශ්වාසය මත පදනම් වෙච්ච ඒ හා බැඳුණු වෛද්‍ය ක්‍රමයක් විදිහට හඳුන්වන එක වැරදි නැහැ.

12. ආයුර්වේද වෛදකම දියුණු කිරීමට කරන්න පුළුවන් මොනවාද?

දැනටමත් ඒක වෙමින් පවතිනවා. වෙනමම ඒකට අවධානයක් යොමු කරන්න ඕනේ නෑ. ලංකාවේ ආයුර්වේද ඖෂධ පිළිබඳ නව පර්යේෂණ සිදු කළ යුතුයි යන මතයෙ මම ඉන්නවා.

මොකද ගෝලීයකරණයත් එක්ක මේ ඔක්කොම දේවල් වෙනස් වෙලා ප්‍රමිතිය අඩුවීමක් වෙලා තියෙනවා. ඒ පිළිබඳ සොයා බැලීම වැදගත්. තව අපිට කරන්න පුළුවන් ජනමාධ්‍ය නවීන තාක්ෂණය යොදාගෙන මේ වෛද්‍ය ක්‍රමය පිළිබඳව දැනුවත් කිරීමට. සාකච්ඡා සම්මන්ත්‍රණ, දේශන පවත්වන්නත් පුළුවන්. අපි මුදල් මතම යැපෙන් නැතිව නිරෝගී බව උදෙසා කටයුතු කරන්න ඕනේ. අපේ තියන අඩුපාඩු හදාගෙන තව තව ඉදිරියට යන්න ඕනේ.

සටහන -
අයි. බී. එස් . හර්ෂණී ජයරත්න
කැලණිය විශ්වවිද්‍යාලය

කැටපත් පවුර
සිතුවිලිවලට පන්හිඳෙන් පිටිය දෙන කැටපත් පවුර

## මම ඉන්නවා නුඹට

දවස තිස්සේම හුස්ම
ගන්නවත් සිහි ඇත්ද
මං ඇහුවා මතකයිද
මැණික රන් කඳ උඹට

කට කොනින් සිනාවක්
අහවරයි හැම ප්‍රශ්න
මැණිකේ ඒ නුඹේ හැටි
මන් දන්නවා ඒක

වැඩ ඉවර වී හවස
මන් එද්දී නුඹේ ළඟට
බෑගය ගනී හනික
එක අතක තේ එකය

ඉඟුරු තේ එකේ රහට
ආදරය මුහු වෙච්ච
මහන්සිය නිමෙනවා
මැණික නුඹ දුටු විගස

දවසකට අපි යමුද
කඩේකින් රෑ කන්න
ඇසුව විට සුදු මුණ
රතු කරන් හොරහින්ම

ඒ සල්ලි ඉතුරු කර
හෙටත් කමු ගෙදරින්ම
මන් හදන මේ කෑම
රස නැද්ද රන් කඳට

මන් හිතුවොතින් නුඹව
නුඹ හිතයි අපි ගැනම
මැණික නුඹේ පිරිමැස්ම
හැඩ කරයි ජීවිතය

රෑ යහන සුව ඇතුව
නිදන්නට ආ විගස
පපු කුහර අස්සේම
හැන්ගේවී ඔය හුස්ම

සමහරක් දින වලට
තුන් කුදේටත් නැමෙන
සුදු මුහුණ කලු වෙච්ච
අමාරුද ඒ රිදුම

අමාරුම දවසකට
ජීවිතේ උඹ වගෙම
මම ඉන්නවා නුඹට
හෙවනැල්ල සේ මෙලෙස

- එම් ජී තාරිකා මධුශානි -

## සිත් අහස

සිත් අහස මඟ බලයි
යළිත් හිරු එන තුරා
හිරු අහස හැර ගිහින්
සඳු ඇවිත් පායලා
හිරු රශ්මි සැර වැඩී
සිත් අහස දවනවා
සඳු සුන්දරයි නමුත්
සිත හිරුට හුරු වෙලා
හිරු දන්නේ සිත් අහස
සඳුගෙ සුව විඳින බව
නමුදු රළු සිත් අහස
හැමදාම ඉකි බිඳින
දැවි දැවීවත් ඉන්න
තව හිරුව සොයනවා

- සචී -

## නුඹ ගැන
### මතක පාරයි සිතුවිලි අවුලා

සුදුවන් සේළ පැළඳූ මහ අහස පුරා
ඇඳිරිය වැටුණු සිතුවම් මගෙ දෙනෙත නුරා
අඩ සඳ එබෙන තුරු මේකුළු සලුව ඉරා
මොහොතක් බලා ඉන්නම් වැව් තලය දිහා

ඔච්චම් පාන වැව් දිය රැළි නිසල වෙලා
නුඹ ගැන මතක පාරයි සිතුවිලි අවුලා
මළ හිරු බහින ගොම්මනකදි දෙනෙත් අයා
වැව් දිය සිඹිමි දිස්වෙන නුඹෙ රුවයි සිතා

සඳරැස් ගලන රෑ අහසක තරුව වෙලා
හිනහෙන දිනක් එනතුරු කලු තිමිර ඉරා
හදවත් පතුල ගැඹුරෙම ඔය රුව අඹලා
කවියක් ලියන්නම් නොරිදා නුඹට හොරා

- G.D මල්ෂා සම්මානී -

## හඳට ගිය ලොකු අයියා

තාත්තව දුටු උලලේනියක්
ගියත් අපිටම බුම්මා
නැති අඩුව නොබලාම ගජයෙක්
තනිව නැහුණාලු අම්මා
පපු කැණැත්තට ගිණිතියා හෝ
බඩගින්න නිවූ පෙම්මා
උණහපුළු පුතු රකින සේයා
දරු සෙනේ නැත නිම්මා

හැඹිලියේ පන් කොළ අස්සෙ
සිදුරෙනුත් රිංගූ දෙයියා
කුණු ඇලේ වතුරටත් කාසිය
යට කරා මේ ගොයියා
ගෙපැලෙ අඟ හිඟ ගින්න දැක දැක
හිටි නමුත් ගොං බයියා

ඒත් හැමදාම හවසට,

අම්මගේ උණු කඳුළු දැක්කත්
හඳට ගියා ලොකු අයියා

- ප්‍රබුද්ධිකා හේරත් -

## Busy

බබා මං හරි busy කිව් උන්
busy වුවෙම අපිට විතරයි
කප්පරක් වැඩ තිබ්බ කාලෙත්
free වුණේ අපි උන්ට විතරයි

ඇත්තටම හරියට **busy** උන්
හොයල බැලුවෙ අපිව විතරයි
අනේ sorry මං busy කියලා
මගෑරියෙ අපි උන්ව විතරයි

- මදුෂා ජයසුන්දර -

# දිල්රංග වීරසූරිය

Dilranga Weerasuriya

මාහු ශ්‍රී ලංකාවේ ඡායාරූප ක්ෂේත්‍රයේ වෙනස්ම හා අලුත්ම අත්දැකීම් සොයන්නෙකු ලෙස හඳුන්වා දෙන්න පුලුවන්. ජීවිතය අලුතින් දිගහරින්නට, ජීවිතය ජය ගැනීමට වෙර දරණ තරුණයකු ලෙස තරුණ තරුණියන්ට ඔහු ආදර්ශමත් චරිතයක්. ඡායාරූපකරණ ක්ෂේත්‍රයේ නව්‍ය තැන් සොයා යන ඔහු නමින් දිල්රංග වීරසුරිය. එසේනම් මෙවර පවුර ඩිජිටල් සඟරාව සමඟ එක්වූ දිල්රංගගේ තතු මෙලෙස ඔහුගෙන්ම විමසා බලමු.



**01 ආයුබෝවන් දිල්රංග, මේ දවස්වල වැඩ කටයුතු කොහොමද?**

ආයුබෝවන්. වසර අවසානය නිසා ව්‍යාපාර කටයුතු එක්ක ටිකක් කාර්යබහුලයි. අලුත් වසරටත් ලහි ලහියේ සූදානම් වෙමින් කාලය ගත කරනවා.

**02 ඔබ ගැන ටිකක් විස්තර කළොත්?**

මම ගැන මම කතා කරනවාට වඩා වෙන කෙනෙක් මම ගැන කතා කරනවා නම් මම අහන් ඉන්න කැමතියි . අම්මා ,තාත්තා, ආදරණීය බිරිඳ හා පුංචි දෝනි එක්ක මේ දිනවල සතුටින් කාලය ගෙවනවා. එළඹිලා තිබෙන කාලය මගේ ජීවිතයේ වාසනාවන්තම කාලයක් කියල මම හිතනවා .

**03 ඔබ ඡායාරූප ක්ෂේත්‍රයට පිවිසෙන්නේ කොහොමද?**

මුලින්ම මම විනෝදාංශයක් විදියට තමයි ඡායාරූපකරණය තෝරගන්නේ. ඉතිං මගේ පළමු පියවරම සාර්ථක වු නිසා මගේ පළමු රැකියාව විදියට ඡායාරූපකරණය වෙත යොමු වුණා. ඉතින් ඒ තෝරගත් දේ නිසා අද මම සාර්ථකයි.

**04 ඔබ මේ ක්ෂේත්‍රයට පැමිණ දැනට කොපමණ කාලයක් ගතවෙනවද?**

දැනට වසර පහක පමණ කාලයක් මම මේ ක්ෂේත්‍රයේ නිරත



වෙනවා. පුංචි කාලයක් වුණත් මේ වසර පහක කාලය තුළ මා විශාල සාර්ථකත්වයක් ලබා ගත්ත කියලා විශ්වාස කරනවා.

**05 මේ කාලය තුළ ඔබට මිහිරි මෙන්ම කටුක අත්දැකීම් වලට මුහුණදෙන්න සිදු වෙන්න ඇති. අමතක නොවන අත්දැකීමක් මතක් කළොත්?**

මම හිතනවා මට කටුක අත්දැකීම් අඩුයි කියලා. මොකද මම ගොඩාක් ආදරෙන් තමයි මේ කටයුතු කරගෙන යන්නේ. අපිට හැමදාම හමුවෙන්නෙ අලුත් මිනිස්සු, අලුත් අත්දැකීම්. ඉතින් ඒ අත්දැකීම් ජීවිතේට පාඩම් කියල හිතනවා.





**06 තරඟකාරී ඡායාරූප ක්ෂේත්‍රය තුළ තමන්ගේ අනන්‍යතාවය පවත්වාගන්නේ කොහොමද ?**

මම මෙහෙම කියන්නම්. ඡායාරූප ශිල්පීන් සිය දෙනෙක් ගත්තොත් සියාකාරයක්. ලංකාවෙත් ,ලෝකෙවත් අංක එකේ ඡායාරූප ශිල්පියා කියල කෙනෙක් මා දකින්නෑ. මොකද මේ කලාව කෙනෙක්ගෙන් කෙනෙක්ට වෙනස් . මගේ ඡායාරූප කෙනෙක්ට ලස්සන වෙන්න පුළුවන්.
තව කෙනෙක්ට ලස්සන නැති වෙන්න පුළුවන්. හැම කෙනෙක්ම මේ ක්ෂේත්‍රයේ තමන් වෙන්න උත්සාහ කළොත්, හැමදාම මේ ක්ෂේත්‍රයේ නමක් තියාගෙන ඉන්න පුළුවන්.

**07 ඡායාරූපකරණය පිළිබඳ හැදෑරීමක් කළ යුතුයි නේද? ඔබ මේ ශිල්පය හැදෑරුව ආකාරයත් සිහිපත් කරමු.**

අනිවාර්යෙන්ම අවශ්‍යයි.මම නුවර ප්‍රදේශයේ ප්‍රසිද්ධ ආයතනයකින් හොඳින් මේ ක්ෂේත්‍රය පිලිබඳ හැදෑරුවා. ඉන් පසුවයි මම මේ ක්ෂේත්‍රයට අවතීර්ණ වුණේ. ඒ වගේම මේ ශිල්පය තුළින් අත්දැකීම් රැසක් වසර කීපයක් තුළ මට එකතු කරගන්න පුලුවන් වුණා. කැමරාවක් අද අරන් හෙට ෆොටෝග්‍රැෆර් කෙනෙක් වෙන්න හිතන්න එපා. ඒ ශිල්පය ගැන හොඳින් හදාරන්න. අත්දැකීම් එකතු කරගන්න. සාර්ථක ඡායාරූප ශිල්පියෙක් බිහිවෙන්නෙ එතකොටයි.

**08 ඔබ ඡායාරූප ක්ෂේත්‍රය තුළ ජනප්‍රියයි . කොහොමද ඔබට ලැබෙන ප්‍රතිචාර?**

ලංකාවේ ඡායාරූප ශිල්පියෙක් වෙන්න හැමෝටම පුලුවන්. හැබැයි ජනප්‍රිය වෙන්න හැමෝටම බෑ. ඒක මගේ වාසනාවට වඩා කැපවීම මත මට ලැබුණ දෙයක්. මගේ ඡායාරූපවලට ආදරේ වගේම මටත් ලොකු පිරිසක් ආදරෙයි. එය මම සමාජය තුළින් අත්දකිනවා. ඒ වගේම මට කතා කරන මාත් එක්ක ඡායාරූප ගන්න පිරිස නිසා මගේ ඇස් පනා පිටම එය ඔප්පු වෙනවා .


**09 ඔබේ ඉදිරි වැඩ කටයුතු ගැන මතක් කළොත්.?**

ඉදිරියේදී අලුත්ම වැඩ ගොඩක් කරන්න හිතන් ඉන්නවා. ඉතිං ඒ ගැන මම කියනවට වඩා හොඳයි නේද දකින එකම. අලුත් වෙනස් විදිහේ මගේ නිර්මාණ ඔයාලට නුදුරේදීම දැකගන්න පුලුවන් වේවි.

**10 ඡායාරූප ක්ෂේත්‍රයට පිවිසෙන්නට බලාපොරොත්තුවෙන් සිටින නවකයින්ට ඔබට ලබාදිය හැකි උපදෙස කුමක්ද ?**

කැමරාවක් අද අරන් හෙට ඡායාරූප





ශිල්පියෙක් වෙන්න උත්සාහ කරන්න එපා. ප්‍රවීණ ගුරුවරයෙක්ගෙන් හෝ ආයතනයකින් ඒ ශිල්පය පිළිබඳව හොඳට ඉගෙන ගන්න. අත්දැකීම් එකතු කරගන්න. වෙනස් විදියට හිතන නිර්මාණශීලී ඡායාරූප ශිල්පියෙක් වෙන්න. එවිට ඔබට වටිනාකමක් ලැබෙයි.

මේ තරම් දුරක් එන්නට අත හිත දුන් අය ගැනත් මතක් කරමු.

මගෙ වටේ ඉන්න මගේ crew එක තමයි අංක එක. හැබැයි මගේ crew එකේ මම බොස් කෙනෙක්ට වඩා team member කෙනෙක් විදියට මම දකිනවා. ඒ වගේම මගේ පවුලෙන් ලැබෙන ශක්තිය වචනවලට පෙරලන්නත් බෑ. ඒ හැමෝටම බොහොම ස්තුතියි.

**11 කලාව සයිබර් අවකාශය තුළ ප්‍රචලිත කරන්නට කැපවෙන පවුර නමැති ඩිජිටල් සඟරාව පිළිබඳව ඔබගේ අදහස කුමක්ද?**

නවක හෝ වේවා ප්‍රවීණ හෝ වේවා කලා ශිල්පීන්ගේ වටිනාකම් ඩිජිටල් සඟරා මාධ්‍යයක් මගින් මෙලෙස සයිබර් අවකාශයේ නිරූපණය කිරීම ඇත්තටම වටින දෙයක්. විය යුත්තේද එයයි. මෙවැනි සඟරා තව තවත් බිහිවිය යුතුයි. අපේ වටිනාකම ලෝකයට පෙන්වන පවුර සඟරාවට බොහොම ස්තුතියි. ලංකාවේ ඩිජිටල් සඟරා අතර ඉහළින්ම වැජඹෙන්නට මගෙන් සුභපැතුම්. මා සමඟ අදහස් බෙදාගත් ඔබටද ස්තුතියි.

කතාබහා -
ඩී එම් චානිකා
කැලණිය විශ්වවිද්‍යාලය

# අමුතු විදිහම ආදරේ නම් ඒක එහෙමම තිබ්බා

# මැයි මාර ප්‍රසංගය



මහින්ද ප්‍රසාද් මස්ඉඹුල

මේ දවස්වල ගොඩක් දෙනා කියවන හරිම අපූරු නවකතාවක් ලෙස මහින්ද ප්‍රසාද් මස්ඉඹුල මහතාගේ මැයි මාර ප්‍රසංගය නවකතාව හඳුන්වා දිය හැකිය. අප්‍රකාශිත ප්‍රේමය හිත යට සඟවාගෙන ලෝකයට පේන්නට ලස්සනට හිනාවෙන තම හැඟීම් සමුදාය බෙදා හරින අපූරු චරිතයක් ලෙස සම්ධ අයියාගේ චරිතය පිටු අතර සේයා මවයි. පොඩිම පොඩි පිටු ටිකකින් , කියල තියන ආදරයේ චමත්කාරයක් පිරුණු මැයි මාර පොතක් .

කුරුළු , කරාඹු නැටි , සාදික්කා සුවඳ වගේ , සදාතනිකව හිතේ නැවතෙන හැඟීමකින් මුසු බදුල්ල , බණ්ඩාරවෙල හීතල හිම මීදුමට එක නිමේශයකින් ගෙනියන සොඳුරු සිත්තමක් බඳුය.

ඔහු කවදාවත් කතා නොකළ දෑසින් විතරක් ඇයව දැක එම ප්‍රේම කතාවට කන්දෙන් කන්දට පා නගන මිහිරාවිගේ අරුත ඇති සංචරණි ලෙස පාඨක නෙතට එම බඳුන් කරයි.

" ආදරයේ
විශ්වීය
පණිවිඩය
අරගෙන
කන්දෙන්
කන්දට
ගමන් කරන
ඉඟුරු මලක් වගේ
දුර්ලභ ළා පාට ගැහැණු
සිහිනය "

මේ කතාව කියවන්නම ඕනේ අමුතු විදිහම ආදරේ නම් ඒක එහෙමම තිබ්බා මේක අපූරු කුතුහලය මුසු මැයි මාර කතාවක්.

" එයා කොහොමහරි මගේ කරගන්න ඕනෙ කියන එක දේශපාලනිකයි , එයා කොහෙ හරි හොඳින් සතුටින් ඉන්න ඕනේ කියන එක විශ්වීයයි "




අහම්බෙන් හරි ඔයා ආවොතින් ගවරවිල කන්දේ මැයි මාර ගහ ආයෙ හොයන්න එපා. එයා එතන නෑ ඒ කන්දෙන් මේ කන්දට යන ගමන් පුරුදු විදිහට පුරුදු තැනම නැවතිලා කිසිම හිස්කමක් නැති වටපිටාව නිදහසේ බලන්න ඔයාගෙ ඇස් නොගැටුණු ඔයාගෙ ඇස් වල ගැටෙන්න බලාන ඉදපු රතු පාට මැයි මාර ගහ ඔයා අනිවාර්යයෙන්ම දකීවි.

එදා වගේම එයත් එක්ක හිනා වෙන්න. මේ කතාවෙ එකම හිස්තැන සම්පූර්ණ කරන්න. මේ ගස ගැන කියන්නම ඔබ මෙහි ඇවිත් ගියා විය හැකිය.

දුලාංජලී හේරත්
විවෘත විශ්වවිද්‍යාලය

# කැපෙන කතුරෙන් උපන් නොකැපෙන මිතුදම

## කතුරු මිතුරු ...........................................










**"විසාල කරදරයක් උනානේ මේක"** මේ වැකිය අද වෙද්දි ඔබ කොතෙකුත් අසා ඇති. ඒ මේ දිනවල තිරගත වන කතුරු මිතුරු චිත්‍රපටයේ ප්‍රේක්ෂකයන් විසින් වැළඳගත් සැම්සන්ගේ දෙබස් ඛාණ්ඩයකි. සිකුරු හතේ, සුහද කොකා වැනි හාස්‍යෝත්පාදක සිනමාපටයන් නිර්මාණය කළ ගිරා නොහොත් ගිරිරාජ් කෞශල්‍යයන්ගේ තිර රචනය හා අධ්‍යක්ෂණයෙනුත්, බාසුරු සිරිවර්ධනගේ නිෂ්පාදනයෙනුත් යුතුව නිර්මාණය වූ මෙම චිත්‍රපටයේ ජයලත් මනෝරත්න, මහේන්ද්‍ර පෙරේරා, රොඩ්නි වර්ණකුල වැනි අතිදක්ෂ රංගන ශිල්පීන් හා නවක නළු නිළියන් රැසක් ද රංගනයෙන් දායක වෙයි. තවත් කෙනෙකුගේ මුවඟට සිනහවක් ගෙන ඒම ඉතා අසීරු කාර්යයක් වුවත් ගිරා එය ඉතා හොඳින් කර ඇති බවක් චිත්‍රපටය දර්ශනය වන පැය දෙක පුරාවටම සිනමා ශාලාව තුළ බඩ පැලෙමින් හිනා වෙන ප්‍රේක්ෂකයන් දැකීම හරහා ඔප්පු වෙයි. චිත්‍රපටයේ සාරාංශ ගත කතාව පිළිබඳව සඳහන් කරනවානම් විල්සන් හා සැම්සන් යන ගජ මිතුරන්ගේ මිතුරුකම ලෙයින් උපන් සහෝදරකමකටත් එහා ගිය එකක් වන අතර විල්සන් පාරම්පරික සන්නාලියෙකුත් සැම්සන් පාරම්පරික ඇඳුම් මසන්නෙකුත් වෙයි.

විල්සන්ට දුවෙක් හා සැම්සන්ට පුතෙක් සිටියි. ඔවුන් දෙදෙනාම විශ්වවිද්‍යාල අධ්‍යාපනය අවසන් කළත් රැකියා නොමැති වීම නිසා ඔවුන් තම පියවරුන්ගේ රැකියාවට සම්බන්ධ වීමට උත්සාහ දරයි. නමුත් විල්සන්ගේ හා සැම්සන්ගේ බලාපොරොත්තුව වූයේ ඔවුන් සමාජයේ උසස් යැයි සැලකෙන රැකියාවන් කරනවා දැකීමය. නමුත් ඒ දරුවන් දෙදෙනා පාරම්පරික සාම්ප්‍රදායික රාමුවෙන් බැහැරව ගමෙන් කොළඹට ගොස් තම පියවරුන්ගේ වෘත්තීන් නවීන සමාජයට ගැළපෙන පරිදි වෙනස් කර ගනිමින් තම ජීවිතය ගොඩනඟා ගන්නා අයුරු මේ කතාව තුළින් ඉදිරිපත් කරයි. අද වන විට රැකියා විරහිත උපාධිධාරීන් දහස් ගණනක් ලංකාවේ ජීවත් වෙයි. ඔවුන් උපාධිය ලබා ගත්තත් තම හැකියාවන් හරිහැටි හඳුනා නොගත් ඔවුන්ගේ ජීවිත හුදු උපාධි සහතිකයකට පමණක්ම සීමා වී ඇත. ඒ කාරණය සහ පියා හා දරුවන්ගේ ඇති බැඳීම පිළිබඳවත් චිත්‍රපටය පුරා ගෙන එනු ලබන හාස්‍යය තුළින් ව්‍යංගාර්ථවත්ව ගෙන ඒමට උත්සාහ කර ඇති බවක් දැකගත හැකිය.

ඉකුත් මාර්තුවේදි මෙම චිත්‍රපටය ඕස්ට්‍රේලියාවේ ප්‍රදර්ශනය කිරීම කර ඇති අතර ලාංකේය චිත්‍රපටයක් වෙනුවෙන් එක් දිනක් තුළ වැඩිම දර්ශන සංඛ්‍යාවක් ප්‍රදර්ශනය කිරීමට ද එහිදී හැකියාවක් ලැබී ඇත. මෙම චිත්‍රපටයේ සිටින විල්සන්ගේ හා සැම්සන්ගේ මිතුරු ආයුධය වූයේ කතුරයි. ඔවුන් කතුරෙන් කෙතරම් කැපිලි කළත් ඔවුන්ගේ මිතුදම කිසිදු කතුරකින් කපා දැමිය නොහැකි එකක් බව කතුරු මිතුරු චිත්‍රපටය පෙන්වාදෙයි.

සටහන -
ඉසුරි එදිරිසිංහ
කැලණිය විශ්වවිද්‍යාලය

# කිල්ල භාවිතා කරන්නෙ ඇත්තටම සමාජ පාලනය කරන්නද.?



ශ්‍රී ලාංකිය සමාජය ප්‍රබල ජනශ්‍රැතිය උරුමකම් කියන සමාජ රාටාවකි. අපේ ඉතිහාසය පිළිබඳ එතරම් ගැටලු නොපවතින්නේ අපගේ ඉතිහාසය ලිඛිත මූලාශ්‍ර පාදක කොටගෙන ලියවී තිබෙන නිසාවෙනි. අතීතය වර්තමානය අතර සම්බන්ධතාවය වර්ධනය කිරීමට ජනශ්‍රැතිය ප්‍රබලවම බලපායි. ජනශ්‍රැතිය ලෙස සරලවම දකින්නෙ ප්‍රාථමික හෝ සංකීර්ණ බවට පත් ජන සමූහයන් අතර කාලයක් තිස්සෙ මුඛ පරම්පරාගතව සම්ප්‍රදායෙන් ව්‍යාප්ත වූ දැනුම් සම්භාරයන්ය. අතීත ජනතාව තුළ තිබූ ප්‍රධාන සන්නිවේදන අවිය කටවහරයි. ඒ තුළ බොහෝ ජනවහර ගොඩ නැංවී තිබෙනු දක්නට ලැබේ.

ලාංකීය ජන සමාජයේ "කිල්ල" යනු ප්‍රබල ලෙසම දක්නට ලැබෙන, සැලකිල්ලට බඳුන් වන සාධකයකි. සමාජයේ සමාජ සාමූහිකත්වයට අවධාරණය කරන, පුදපූජා යාතුකර්ම රැසකට මගපාදන සාධකයක් ලෙස සැලකිය හැකිය. කිල්ල සමාජයේ තිබෙන අධි විශ්වාසයකි. සිංහල ජන සමාජය තුළ තහංචිවල ඉහල බවක් දක්නට ලැබේ. කිල්ල තහංචියට වඩා වෙනස් වන බවක් හඳුනාගත හැකිය.

සමාජයේ  කිල්ල ලෙස පිළි ගැනෙන , කිලි ප්‍රධාන වශයෙන් සිව් වැදෑරුම්ය. ඉන් ප්‍රබල කිල්ල  ස්ත්‍රිය ප්‍රථම වතාවට ඔසප් වීම තුළ ඇතිවන කිල්ලයි. එම කිල්ල ජන පිළිගැනීම අනුව මාස තුනක කාලයක් පවතින බවට පිළිගනී. කිල්ල තිබෙන නිවසට පැමිණෙන සියලු දෙනා කිල්ලට හසුවන බවට ද සමාජය සම්මත කොටගෙන තිබේ. ගැහැණු දරුවන් වැඩිවියට පත් වීම සමාජය පිළිගනු ලබන ආකාරය වෙනස්ය. එතැන් පටන් සමාජානුයෝජන ක්‍රියාවලිය ද වෙනස් ලෙසට ගොනුවනු ලාංකීය සමාජයෙන් දක්නට ලැබේ. එය ඇතැම් විට පළාතෙන් පළාතට වෙනස් ලෙසට සිදුකිරීම් ද දක්නට ලැබේ.  කෙසේ නමුදු සමාජය පිළිගනු ලබන ප්‍රබලම කිල්ල බවට මෙම කිල්ල ජනශ්‍රැතිය තුළ දක්නට ලැබේ.

මීළඟට වැදගත් කිල්ල වනුයේ මරණ කිල්ලයි. නිවසක පුද්ගලයෙකු මියගිය පසු එම නිවස කේලි නිවසක් බවට සලකයි. එම නිවසේ සිටින ලේ ඥාතීන්ද කිල්ලට හසු වූ පුද්ගලයන් ලෙස සලකයි. මෙම කිල්ල ප්‍රබල ලෙස සැලකීම කෙතෙක්ද කිවතොත් එම නිවසද, ඥාතීන්ද මාස තුනක් පවතින බව ජනශ්‍රැතිය තුළ පිළිග නී. නිවසට පැමිණි අයෙකු සිටිනම් ඔවුන්ට ද කිල්ල බලපාන අතර ලේ ඥාතීන් නොවේනම් ඔවුන්ට දෙහි ගා හිස නෑමෙන් කිල්ලෙන් මිදීමට අවස්ථාව තිබේ. තවද ඇතැම් පිරිස් කහ මිශ්‍ර දිය නෑම, දෙහි පුළුස්සා ගා නෑම, ආදිය සිදුකොට කිල්ල සෝදා හරිනු ලබයි.

තෙවන ප්‍රබල කිල්ල වැදුම් ගේ කිල්ලයි. නිවසක දරුවකු වැදුවේ නම් එම නිවස තුළ තෙමසක් යන තෙක් කිල්ල තිබෙන බව ජන සමාජය පිළිගනී. නිවසට යන කවරෙකු වුවද වැදුම් ගේ කිල්ලට හසු වේ. තව ද අනෙක් කිලි ඇතිවනුයේ ආහාර ගැනීම තුළයි. මෝර මාළු, ඌරු මස්, මගුරුන් මාලු, අලුපුහුල්, ආදිය ආහාරයට ගත් පසු කිල්ලට හසු වන බව දක්වයි. මෙම කිල්ලෙන් මිදීමට දෙහි ගා හිස නෑමෙන් කිල්ලෙන් මිදීමට අවස්ථාව තිබේ. සමාජ සම්මතය තුළ තිබෙන පිළිග ැනීම අනුව කිල්ලට හසුවන තවත් අවස්ථා ලෙස ගැබිනියන් වී, පන් නෙලීමට යාම, පිළීමසු කමතට ගෙන යාම ආදිය තුළ කිල්ලට හසුවන බව දක්වයි.

ලාංකීය සමාජය ප්‍රබල ජනශ්‍රැතියක් තිබෙන ලිඛිත අතීතයක් තිබෙන රටකි. සමාජය තුළ විවිධාකාර වූ සමාජ සම්මුති, නීති, රීති තිබීම සාමාන්‍යය. එසේ කරනුයේ සමාජය නීති වලින්ම පාලනය කරනවා වෙනුවට සමාජ සම්මුතිවල සිට සමාජයේ තිබෙන ගැටලු නිරාකරණය කිරීමයි. එය සරල සමාජයක ලක්ෂණයකි. සිංහල ජන සමාජය සමාජ සම්මුතී නීති වෙනුවට රීති වලින් පාලනය වීම ජනශ්‍රැතිය දෙස බැලීමේදී ප්‍රබල ලෙසම දක්නට ලැබේ. නීතියක් වෙනුවට සම්මතයක් තුළ ක්‍රියා කිරීම සරලය. කිල්ලද එසේ සමාජය පාලනය කිරීමට යොදාගන්නා ලද සම්මතයක් බවට සිතීම සාධාරණය. කිල්ල තුළ සිදුවනුයේ සමාජය පාලනය කිරීමයි. කිල්ලට කාලයක් තීරණය කරනුයේ පාලනය සිදුවීමේ කාලය නිර්ණය කිරීමටය.

කිල්ල තුළ සමාජය යම් පාලන සීමාවකට යටත් කිරීම සිදුකරනු ලබන බව විමසීමට අවකාශය තිබේ.  ප්‍රබලම කිල්ල ගැහැණු දරුවකු පළමුව ඔසප් වීමයි. මෙහිදී එම කාන්තාවට කිල්ල මගින් ආරක්ෂාව බලාපොරොත්තු වනවා විය හැකිය. සමාජයේ නවමු අවස්ථාවකට එළඹෙන කාන්තාව ආරක්ෂාව බලාපොරොත්තු වේ. මාස තුනක් එම නිවස තුළ කිල්ල තිබීම තුළ නිවසට පිරිස යාම පාලනය වේ. ඒ තුළ යම් ආකාරයක කාන්තාවට ආරක්ෂාව බලාපොරොත්තු වනවා විය හැකිය.


දෙවනුව මරණ කිල්ල මාස තුනක් නිවස තුළ තිබෙන  සමාජය සලකයි. මරණය සිදුවූ නිවසක් තුළ විසබීජ තිබීම නවීන විද්‍යාවට අනුව සාමාන්‍යය. එම නිවසේ විසබීජ දීර්ඝ කාලයක් තිබීමට ද අවස්ථාව තිබේ.  ඒ තුළ මිනිසුන් එම නිවසට යාම පාලනය කිරීමට කිල්ල යොදාගනු ලබනුයේ විසබීජ ව්‍යාප්තිය පාලනය කිරීමේ අරමුණින් විය හැකිය. එසේම දෙහි ,කහ මිශ්‍රණ තුළින් විසබීජ විනාශ කිරීමට ද අවකාශය තිබෙන බවට නවීන විද්‍යාව තුළද පිළිගනී. මරණ නිවසට පැමිණි අයෙකු දෙහි, කහ ගා පිරිසිදු වීම තුළ විෂබීජ පාලනය කිරීම සිදුකරනු බවට පිළිගත හැකිය.

තෙවනුව සතුන්ගේ මාංශ අනුභවය තුළ කිල්ලට හසු වේ. කිල්ලට හසුවන මස් ඇති සතුන් විෂබීජ සහිත සතුන්ය. එය පාලනය කිරීමට කිල්ල සමාජය තුළ යොදාගනු ලැබුවා යැයි සිතීම සාධාරණය.  තවත් ප්‍රබල කිල්ලක් වනුයේ වැදුම්ගේ කිල්ලයි. කුඩා දරුවකු ඉපිද මාස තුනක් යනතෙක් නිසි ප්‍රතිචක්‍රීකරණ රටාවකට අනුවර්තනය නොවේ. වැදුම් ගේ කිල්ල මාස තුනක් තිබෙන බවට පිළිගැනීම තුළ එම නිවසට පිරිස යාම පාලනය කරයි.

එමගින් අලුත උපන් බිළිදාට පිටතින් විෂබීජ පැමිණීම පාලනය වීමද සිදුවේ. සමාජයේ අධි විශ්වාස අතර ඉහළින්ම තිබෙන කිල්ල මගින් සමාජය මනාව පාලනය කිරීමට ලක් කරයි. සමාජයේ නීති වෙනුවට කිල්ල නමැති අධි විශ්වාසය තුළ මිනිසුන් පාලනය කිරීම තුළම සමාජයේ සහසම්බන්ධතාවය, සමාජ සහජීවනය ප්‍රබල ලෙසම ආරක්ෂා වීම සිදුවේ. කිල්ල යනු විද්‍යාත්මක පදනමක් නොමැති සාධකයකි. ඒ තුළ කිසිදු සාධාරණ හෙළිවීමක් නැත. නමුත් සමාජය අවශ්‍ය අවස්ථා වලදී පාලනය කිරීමට ජනශ්‍රැතිය තුළ කිල්ල ප්‍රබල ලෙසම විශ්වාස කරනු ලබන අධි විශ්වාසයක් ලෙසට දක්නට ලැබේ.

සටහන -
නෙත්සර අශේන් හේවගේ
ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය





# කඳු මුදුනක මහා කැලයෙන් වට වූ පිට්ටනිය

අතීතයේ ගවරා නම් සත්වයා වාසය කළ ලංකාවේ අවසන් ඉසව්ව ලෙස මෙම ගවරවිල තැන්න හැඳින්වේ. ගවරා යනු විදෙස් රටවල සිටින බයිසන් ගවයා මෙන් විශාල සතෙකු බව ජනප්‍රවාදයේ සඳහන් වේ. විටෙක බයිසන් ගවයන් අතීතයේ මෙහි ජීවත් වූවා විය හැකිය. ගවරුන් දඩයමට ලක් වීමත්, බ්‍රිතාන්‍යයන් විසින් මධ්‍ය කඳුකරයට සිදුකළ විනාශත් නිසාවෙන් මෙම සත්ත්වයින් මිහිමතින් වඳ ම ගොස් ඇති බවට උපකල්පනය කරනු ලබයි. අද වන විට ගවරා සිටි විල ගවරවිල කියා හඳුන්වනු ලබයි. ගවරවිල යනු විශාල කඳු වැටියකි. මෙය මධ්‍යම පළාතට මායිම් ව ඇත. මෙය පළාත් දෙකක් යා කරනු ලබන ඉසව්වක් කීව ද නිවැරදිය. ඒ සබරගමුව හා මධ්‍යම පළාත යි. ගවරවිල ප්‍රධාන කන්දේ උස මීටර 1980ක් පමණ වන අතර ඊට අමතරව මීටර 1900 වඩා උසැති අවශේෂ කඳු දෙකක් මෙහි පිහිටා ඇත. මේ වන විට එය දෙස් විදෙස් සංචාරකයින් අතර ජනප්‍රිය සංචාරක ගමනාන්තයකි.

පරිසරවේදීන් පරීක්ෂකයන් පවා මේ ස්ථානයට පැමිණෙන්නේ යුග ගණනාවකට පෙර "ගවරා" සත්වයාගේ පැවැත්ම පිටුපස ඇති අද්භූත කතාන්දර සොයා ගැනීමේ අභිප්‍රායෙනි. "ගවරවිල තණ" වනය කිලෝමීටර 3 පමණ විහිදෙයි. පුළුල් පරාසයක වර්ණ හා මනරම් දර්ශන සමඟ ජලධාරා තැනිතලා බිම් හරහා ගලා යයි. මෙය සමන් දෙවියන්ගේ අඩවිය වන්නා වූ අතර මාළස්සාකැලේට ගලායන ගවරවිල ඇල්ල මුදුනට නැගි විට සමනල කන්ද අපූරුවට දැක ගැනීමට පුළුවන. වනාන්තරය මාන පඳුරු වලින් අලංකෘතය. අධික වර්ෂා සමවල දී මෙම ඉසව්ව ජලයෙන් යට වේ. ප්‍රධාන ජල පෝෂකයක් වන මෙම සමස්ත කඳුවැටිය මතින් දිය ඇලි දහයක් පමණ උපත ලබයි. මෙහිදී කැලණි නදියේ මෙන් ම වලවේ නදියේත් දියවර සදන තවත් අවශේෂ දිය උල්පත් මේ අවට දක්නට ලැබෙන්නා වූ අතර ශ්‍රී ලංකාවේ මිරිදිය මත්ස්‍ය විශේෂ බොහොමයක් මෙහි දිය මාර්ග ආශ්‍රිතව දැක ගත හැකිය.

ගවරවිල තැන්නේ උඩුගුවන නිල් පැහැති වලා කැටි වලින් සැරසෙමින් පවතී. නිල් අහස යට මලින් එලින් බර වූ මනස්කාන්ත දසුනින් සැරසීගත් තුරු ලතා අතර සැරිසරන අනේකවිද වූ සත්ත්ව සංහතියේ නිදහස චමත්කාරවත් වූ අයුරින් නිරූපිත වන්නා වූ අතර සැඟවුණු වනජීවීන් රැසක් මෙකී පරිසර පද්ධතිය තුළ වාසය කරන බව නිසැක ය. දිනෙන් අඩක් නිමාවත්ම මිහිදුමින් හාත්පස වැසී කඳු පන්ති වැසී යමින් පවතී. අධික ශීතල සහ අධික සුළඟ සංචාරකයන්ගේ විඩාබර බව දුරු කර හරින්නා වූ පාරිසරික ඔසුවකි.

දැඩි නිහැඬියාවක් පවතින මෙකී ගවරවිල තැන්න හා ඒ අවට පරිසර පද්ධතිය පිළිබඳ මනා අවබෝධයක් සහිත ගම්වැසියන් ගවරවිල තැන්නට යන මාර්ගයන්ගේ දිශානතීන් හා මඟ බාධකයන් පිළිබඳ සංචාරකයින්ට අවබෝධයක් ලබා දෙනුයේ හෘදයාංගමව ය. එහිලා, සහෝදර වතුකර දෙමළ ජනයාගේ දැනමුතුකම හා ලෙන්ගතුකම මෙකී සංචාරය ඉතාමත් රසවත් වීමට හේතු වේ.

මෙහි දී, අව්‍යාජ අත්දැකීමක් ලබා ගැනීමට පිපාසයෙන් සිටින දේශීය හා විදේශීය සංචාරකයින්ගේ සංචාරක කුසගින්න තෘප්තිමත් කිරීම සඳහා "ගවරවිල" ඉතා සුන්දර වූ නවාතැන්පලක් ලෙසින් පෙන්වා දිය හැකිය.

සටහන -
පසිඳු පෙරේරා.
කැළණිය විශ්වවිද්‍යාලය

# Happy Pongal

ඩා බිඳු වගුරුවා
නෙලූ රන් අස්වනු
ක්ෂීර ගගුලක දොවා
පුදමි හිරු දෙවිදුන්ට

නේක විසිතුරු පාට
හැඩ කෝලම් රටා මැද
බෙදා දෙමු අස්වැන්න
සිත් තුටින් නෙක සතට

ඉදින් හිරු දෙවිදුනේ
නුඹ හටද මෙපින් ලැබ
නව වසර සරු වෙන්ට
දෙවන් ආසිරි අපට

- ප්‍රබුද්ධිකා හේරත් -



### මෙවර කලාපයේ කතුවරුන්

- ප්‍රබුද්ධිකා හේරත්
- හර්ෂණී ජයරත්න
- ඩී එම් චානිකා
- දුලාංජලී හේරත්
- ඉසුරි එදිරිසිංහ
- නෙත්සර අශේන්
- පසිඳු පෙරේරා
- තාරිකා මධුශානි
- මල්ෂා සම්මානි
- මදුෂා ජයසුන්දර
- සචී

### සංස්කරණය

- තුෂාන් බණ්ඩාර
- සුලෝචනා නදීෂානි
- හිමාෂා රණතුංග
- පබසරා ගීවින්දි

### අධීක්ෂණය

- ප්‍රියශාන් මදුසංක
- තුෂාන් බණ්ඩාර

### වෙබ් සංස්කරණය

- චතුර කවිදු

Pawura
Digital Magazine

නව්‍යකරණයෙන් ඉදිරියට
ඩිජිටල් කලාවේ නවතම පෙරළිය
Pawura Digital Magazine

All images are copyrighted by their original owners

9 772961 526004